# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,954 - 2016 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2016.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු — ඇබෑර්තු

#### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 14 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජනවාරි මස 22 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | පානදුර | කළුතර, පානදුර හා තොටමුණ කොට්ඨාසයේ එළුවිල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

02-267

---

#### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 14 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජනවාරි මස 21 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අනුරාධපුර | මධ්‍යම නුවරගම් පළාත | උතුරු නුවරගම් කෝරළය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ නුවරගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |

02-268

---

#### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ **I** ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති) තනතුරු සඳහා බඳවා ගැනීම - 2016

අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති) තනතුරු 02ක පවතින පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, ''කොළඹ 12'' යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ ''විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති) තනතුරු සඳහා බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.04.18 දින වේ.

සටහන.—ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006, රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 ක (මාසික) වැටුප් පරිමාණය හිමි අතර, එහි 20 වන වැටුප් පියවරෙහි (රු. 36,755) පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

04. සුදුසුකම් :

(i) රජයේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක විධායක ගණයේ නීති නිලධාරී තනතුරක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
(ii) එම කාලය තුළ විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.
(iii) මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි වීම.
(iv) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව මෙම තනතුරට බඳවා ගන්නා දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතු අතර, නියමිත වැටුප් වර්ධක 05 උපයාගෙන තිබිය යුතුය.

05. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

06. වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.

08. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ ක්‍රමය :

| විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|
| 01. **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | |
| (i) නීති ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය | 25 | |
| (ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පිරිනමනු ලබන පශ්චාත් නීතිවේදී උපාධිය (LLM) | 20 | 25 |
| (iii) පාඨමාලාවේ කාලසීමාව එක් වසරකට නොඅඩු වූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 10 | |
| (iv) පාඨමාලාවේ කාලසීමාව මාස 06කට නොඅඩු වූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 05 | |
| 02. පළපුරුද්ද<br>රජයේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක විධායක ගණයේ නීති නිලධාරී තනතුරක I වන ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස සක්‍රීය හා සතුටුදායක වෘත්තීය පළපුරුද්ද<br>(එක් වසරකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 30 කි.) | වසරකට ලකුණු 03 බැගින් | 30 |
| 03. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | | |
| (i) උපාධිය, පශ්චාත් උපාධිය, නීතිවේදී පාඨමාලාව, පශ්චාත් නීති පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම. (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.) | 20 | |
| (ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව (පාඨමාලාවේ කාලසීමාව මාස 06කට නොඅඩු වූ) | 15 | 20 |
| (iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පාඨමාලාවේ කාලසීමාව මාස 03කට නොඅඩු වූ) | 05 | |
| 04. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | | |
| (i) සන්නිවේදන කුසලතා | 10 | |
| (ii) කළමනාකරණ කුසලතා | 05 | 25 |
| (iii) නායකත්ව කුසලතා | 05 | |
| (iv) පෞරුෂය | 05 | |
| එකතුව | | 100 |

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.*

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මාර්තු මස 04 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2016 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.*

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

09. ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22x29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1 සිට 12 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 13 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව සකසන්න. ඉල්ලුම්පත්‍ර ලැබුනු බව දන්වනු නොලැබේ.

සැළකිය යුතුය .— (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(ඇ) අයදුම්කරුවන් විසින් අදළ අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියට අදළ වූ බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2016 ජනවාරි මස 27 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධිකරණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති) තනතුර සඳහා අයදුම්පත්‍රය

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. උපන් දිනය :————.

08. විවාහක/අවිවාහක බව :————.

09. දැනට සේවය කරන රජයේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

10. දැනට දරන තනතුර :————.

11. රජයේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක,
(a) විධායක සේවා ගණයේ තනතුරකට පත්වූ දිනය:————.
(b) විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ තනතුරකට පත්වූ දිනය:————.

12. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 08 ඡේදයට අනුව සුදුසුකම් :-
(i) ………………………………………
(ii) ………………………………………
(iii) ………………………………………
(iv) ………………………………………
(v) ………………………………………

13. භාෂා ප්‍රවීණතාව : (අදාළ තීරුවේ (√) ලකුණ යොදන්න.)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

*අයදුම්කරුගේ සහතිකය*

………………………වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරාගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත්වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරුවන් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය……………………………මහතා/මෙනවිය/මිය දැනට/ ………… අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ……………… වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහත 9, 10, 11 මගින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතින/නොපවතින බවත්, ඔහු/ඇය අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති/නැති බවත්, නියමිත වැටුප් වර්ධක 05 උපයාගෙන ඇති/නැති බවත්, වැටුප් රහිත හෝ අඩ වැටුප් සහිත නිවාඩු ලබාගෙන ඇති/නැති බවත්, ඇයගේ/ඔහුගේ රාජකාරි, පැමිණීම, හැසිරීම, කාර්ය සාධනය, සතුටුදායක/අසතුටුදායක බවත්, සහතික කරමි.

……………… මහතා/මෙනවිය/මිය මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත්, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද දන්වමි.

————,
අමාත්‍යාංශ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

02-396

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මුදල් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 මැයි මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේ දී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාවය.*—

(i) සෑම අපේක්ෂකයකුම, ඔහු/ඇය :-

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු බවත්,
(ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු බවත්,
(ඇ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 28 ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂිවලින් ඔප්පුකළ යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය (1994.03.14 දින හෝ ඊට පෙර හා 1988.03.14 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

සටහන .— යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) **ශාරීරික යෝග්‍යතාවය.**—පිරිමි අපේක්ෂකයෙකුගේ උස අඩි 5 අඟල් 5 කට අඩු නොවිය යුතු අතර, පපුව (ප්‍රසාරණය කළ විට) අඟල් 33 ට නොඅඩු විය යුතු ය.

අපේක්ෂිකාවන්ගේ උස අඩි 5 යි අඟල් 03 කට නොඅඩු විය යුතු ය.

(iii) අධ්‍යාපන සුදුසුකම්.-සෑම අපේක්ෂකයකුටම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතු ය. :-

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක්;

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (වෛකල්පිත සාමාර්ථය අදාළ නොවේ.);

හෝ

අ. පො. ස. උසස් පෙළ ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සටහන.— උපාධියකට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයෙකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුව ද පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමත් වූ අයෙකුට ඔහු/ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිගෙන් ලබාගත් නිල ලිපියක් ඉදිරිපත්කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකිය.

03. *සේවා කොන්දේසි* :—

(i) *වැටුප:*— මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.:—

රා. ප. චක්‍රලේඛ අංක : 6/2006 (iv) — MN5-2006A
රු. 16,720 - 320 x 10 - 365 x 11 - 450 x 15 — රු. 30,685

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතු ය.

(vi) මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම් වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය* : බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ. :—

| | |
|---|---|
| (i) අභියෝග්‍යතාව පරීක්ෂණය (පැය 01 යි)<br>(ii) ඉංග්‍රීසි භාෂාව (පැය 1 1/2 යි) | ලකුණු 100 යි<br>ලකුණු 100 යි |
| එකතුව | 200 යි |

*අභියෝග්‍යතාව ප්‍රශ්න පත්‍රය.*— මෙම ප්‍රශ්න පත්‍රයට අපේක්ෂකයින්ගේ/ අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය.*— අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස්වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**සටහන.**—මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසියන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කර ඇති අපේක්ෂකයින්ට/ අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැළකිය යුතු ය.

(iii) *ඇගයීමේ ක්‍රමය.*- තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ලකුණුවල එකතුවට අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඔවුන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අපේක්ෂකයාගේ සිට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුපාතිකව අපේක්ෂකයින් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහිදී අපේක්ෂකයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, සුදුසුකම් පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරුවල සත්‍යතාව වැනි කරුණු මෙහි දී පරීක්ෂා කරනු ලැබේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල.*— කලාප මට්ටමේ ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවැනි ස්ථානයට ලකුණු 2 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 1 යි.

දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 4 යි. දෙවැනි ස්ථානයට ලකුණු 3 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 2 යි.

ජාතික මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 5 යි. දෙවැනි ස්ථානයට ලකුණු 4 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 3යි.

කලාප තරගවලදී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 3යි. දෙවැනි ස්ථානයට ලකුණු 2යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 1 බැගින් ලබා දෙනු ලැබේ.

දිස්ත්‍රික් තරගවල දී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 4 යි. දෙවැනි ස්ථානය සඳහා ලකුණු 3යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 2 බැගින් ලබා දෙනු ලැබේ.

ජාතික මට්ටමේ තරගවල දී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 5යි. දෙවැනි ස්ථානයට ලකුණු 4යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 3 බැගින් ලබා දෙනු ලැබේ.

05. *තෝරා ගැනීමේ පදනම.*— ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් අදළ බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරාගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10%කට නොවැඩි ප්‍රමාණයක් අපේක්ෂිකාවන් සඳහා වෙන් කෙරේ.

05. (I) *ප්‍රතිඵල නිකුත් කිරීමග"* ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම්දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

*සටහන.*—රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරීන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන් හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල* :

(i) *ආදර්ශ අයදුම්පත* .—මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදි ම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතු ය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතු ය. (ආදර්ශ අයදුම්පත්‍රයේ 01 සිට 05 තෙක් ශීර්ෂ 1 වැනි පිටුවට ද, 06 සිට 10 තෙක් ශීර්ෂ දෙවැනි පිටුවේ ද, ඉතිරිය තුන්වැනි පිටුවට ද, වන සේ A 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න). ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අයදුම්පත් 2016 මාර්තු 14 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේවිභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 750 ක මුදලක් ගෙවා ලබාගත් ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. 2016 මාර්තු 14 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතු ය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(v) *සහතික කිරීම.*-දැනට රජයේ සේවයේ යෙදී සිටින අයැදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන්, හෝ යුධ හමුදාවක කොමිෂන්ලත් නිලධාරියෙකු, වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

08. (i) *විභාග ප්‍රවේශ පත්‍ර.*— ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, අදල නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව වෙත ඒ පිළිබඳව දන්වා සිටිය යුතු ය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබාගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම*"විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂයෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. එසේ නොකරන අපේක්ෂකයෙකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම *ගැසට්* පත්‍රයේ පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

**සටහන** : විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ.

09. *අනන්‍යතාවය.*"අපේක්ෂකයින් විභාග ශාලව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ. :—

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ආ) මෙම විභාග දිනට අවුරුදු 05කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්). ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි* :

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හා අදාළ වේ නම්, ශීර්ෂ අංක 02හි 'සටහන' යටතේ දක්වා ඇති අවශ්‍යතාව සඳහා වූ ලේඛනය හැර සහතිකපත්, ඒවායේ ඡායා පිටපත් හෝ වෙනත් කිසිඳු ලිපි ලේඛනයක් නොඑවිය යුතු ය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම, විස්තර අයැදුම්පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයැදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සටහන.**—එම සහතිකය සමාදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතු ය. (රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.).

(අ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

**සටහන් .**— (i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උද්ධෘත භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා/ අපේක්ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි).

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් එනම්, අපේක්ෂකයා උපාධි විභාගය සමත් බවට විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරි විසින් නිකුත් කරන ලද නිළ ලියවිල්ලක් හා විභාග දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය.

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක් වූ කුසලතා සම්බන්ධ ලේඛන.

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සෙකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ කවර අවස්ථාවක දී වුව ද, ඔහුගේ/අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය. අපේක්ෂකයකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවංලගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ *II* වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016**

Open Competitive Examination for Recruitment to Posts of Assistant Superintendent of Customs, Grade II of Sri Lanka Customs Department - 2016

විභාගයට පෙනී සිටින භාෂා මධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(**උදා**.- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව දා යොදු නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(**උදා** : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය :

3.2 නිකුත් කළ දිනය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචියෙන් - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජනවර්ගය :
සිංහල 1
ලංකා දෙමළ 2
ඉන්දියානු දෙමළ 3
මුස්ලිම් 4
බර්ගර් 5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
වෙනත් 6

07. උපන් දිනය :
(අ) අවුරුද්ද : මාසය : දිනය :

(ආ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු : මාස : දින :

08. ශාරීරික යෝග්‍යතාවය :
(i) උස : අඩි ………… අඟල් …………

(ii) පපුව (ප්‍රසාරණය කළවිට) : අඟල් …………
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි.)

09. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවකු වී තිබේ ද? ඔව්/නැත
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න. :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

| *විශ්වවිද්‍යාලයේ නම* | *උපාධිය* | *උපාධියේ පංතිය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|---|---|
| | | | | |

(i) අ. පො. ස. (සා. පෙළ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමාර්ථ්‍යය :
වර්ෂය :————.
විභාග අංකය :————.

(ii) අ. පො. ස. (උ. පෙළ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමාර්ථ්‍යය :
වර්ෂය :————.
විභාග අංකය :————.

11. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතු ය)
(i) ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.
(iv) ලදුපතේ අංකය :————.
(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු ය)

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

12. අයදුම්කරුගේ ප්‍රකාශය/සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න).

මෙම අයදුම්පත ඉදිරිපත් කරන …………………… නමැති මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය …………………… මස ………… වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

සටහන : අයැදුම්පත සහතික කළ යුත්තේ *ගැසට්* නිවේදනයේ 7 (V) ඡේදයේ සඳහන් පරිදිය.

14. *ආයතන ප්‍රධානියාගේ නිර්දේශය* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන …………………… මහතා/ මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කල හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව)

දිනය :————.
ආයතන ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
සේවා ස්ථානයේ ලිපිනය :————.

02-306

---

**මුදල් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 මැයි මාසයේදී දිවයින පුරා පිහිටි පහත දැක්වෙන ප්‍රධාන නගර වලදී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේදී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.
විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක —

| *පළාත* | *නගරය* | *නගර අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොලොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොණරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් අයදුම්කරුගේ දෙවන තේරීම අනුව සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත එම අයදුම්කරුවන් යොමු කරනු ලැබේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. යෝග්‍යතාව -
(i) සෑම අපේක්ෂකයෙකුම ඔහු/ඇය
(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බවත්,
(ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු බවත්,
(ඇ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 24 ට නොවැඩි බවත්, පිළිගත හැකි සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1998.03.14 දින හෝ ඊට පෙර හා 1992.03.14 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

සටහන .— යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) ශාරීරික යෝග්‍යතාවය .— පිරිමි අපේක්ෂකයෙකුගේ උස අඩි 05 අඟල් 05 ට අඩු නොවිය යුතු අතර, පපුව ප්‍රසාරණය කළ විට පපුව අඟල් 33 ට නොඅඩු විය යුතුය. (මෙය අපේක්ෂිකාවන් සඳහා අදල නොවේ.)

ගැහැණු අපේක්ෂිකාවන්ගේ උස අඩි 05 යි අඟල් 03ට නොඅඩු විය යුතුය.

(iii) අධ්‍යාපන සුදුසුකම් .— සෑම අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය. :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් තුනකින් එකවර සමත්වීම.;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයන් වශයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ්‍යයන් සහිතව සම්මාන සාමාර්ථ්‍යයන් පහක්ද, ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත් විය යුතුය.

03 සේවා කොන්දේසි :

(i) වැටුප .— මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ. :—

රා.ප.චක්‍රලේඛ අංක : 6/2006 (iv) - R-S-1-2006
රු. 14,280 - 145 x 7 - 180 x 10 - 240 x 17 - රු. 21,175

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන් විසින් තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදු විය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතුය.

(vi) මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. විභාග පරිපාටිය .— බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| (i) | අභියෝග්‍යතාව (පැය 01 යි) | ලකුණු 100 යි |
| (ii) | ගණිතය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (iii) | ඉංග්‍රීසි භාෂාව (පැය 01 1/2යි) | ලකුණු 100 යි |
| | එකතුව | ලකුණු 300 යි |

අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ/ අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය, හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ගණිතය.—ගණිත හැකියාව මැනීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය : අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ, ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

සටහන .—මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අපේක්ෂකයින්ට/ අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) ඇගයීමේ ක්‍රමය .— තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව ලකුණු ලබා ගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් පවත්නා පුරප්පාඩු අනුව අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී, ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10ක් ලබාදෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහිදී අපේක්ෂකයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, විභාගයේ දී ලබාගත් ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු පමණක් සැළකිල්ලට ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල :

කලාප මට්ටම් ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවැනි ස්ථානයට ලකුණු 2 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 1 යි

දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 4 යි. දෙවැනි ස්ථානයට ලකුණු 3 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 2යි.

ජාතික මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 5 යි. දෙවැනි ස්ථානයට ලකුණු 4 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 3 යි.

05 *තෝරා ගැනීමේ පදනම.*—ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් අදළ බඳවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයක් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරාගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10% කට නොවැඩි ප්‍රමාණයක් අපේක්ෂිකාවන් සඳහා වෙන් කෙරේ.

05. (i) *ප්‍රතිඵල නිකුත් කිරීම.*-ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු හා සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

සටහන.—රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරීන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල :*

(i) *ආදර්ශ අයදුම්පත.*—මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතු ය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතු ය. (ආදර්ශ අයදුම්පත්‍රයේ 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු වැනි පිටුවට ද, 06 සිට 11 තෙක් ශීර්ෂ දෙවැනි පිටුවේ ද ඉතිරිය තුන්වැනි පිටුවටද, වනසේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න) ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(ii) අයදුම්පත් 2016 මාර්තු 14 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය. (සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 500ක මුදල් ගෙවා ලබාගත් ලදුපතක් අයදුම් පත්‍රයට අමුණා එවිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. 2016 මාර්තු 14 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුනහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ''දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වන ඇත."

(v) *සහතික කිරීම.*- දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියෙකු, වාර්ෂිකව රුපියල් 240,360ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතුය.

08. (i) *විභාග ප්‍රවේශ පත්‍ර.*- ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, නගරය අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, අදල නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම් කරුවෙකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක්ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම* - විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂයෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අපේක්ෂකයෙකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

*සටහන.*—විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාගයට පෙනී සිටීම සඳහා සියළු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. *අනන්‍යතාව.*—අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ආ) මෙම විභාග දිනට අවුරුදු 05 කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. සුදුසුකම් පිළිබඳ ලියවිලි :

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හැර වෙනත් කිසිදු ලිපිලේඛනයක් නොඑවිය යුතු ය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාවය ඔප්පු කළ යුතු ය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සටහන** : එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරෙකුගෙන් වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එය පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතු ය.

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

**සටහන් :**

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උධෘත භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා/ අපේක්ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි),

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිලි,

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවල දී දැක් වූ කුසලතා සම්බන්ධ ලේඛන,

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. සාවද්‍ය තොරතුරු සැපයීම.- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පලවන නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පැන නැගුනහොත් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක : 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016

| 189. | 62181 | ඇලුමිනියම් හැදි | 01 |
| 190. | 58231 | ටේප් | 01 |
| 191. | 58241 | ප්ලාස්ටික් තාච්චි | 01 |
| 192. | 58392 | මේසන් හැදි | 01 |
| 193. | 58397 | ඇණ 100g | 01 |
| 194. | 58736 | ටැප් | 01 |
| 195. | 58741 | පර්ස් | 01 |
| 196. | 58750 | නයිට් බල්බ් | 01 |
| 197. | 59065 | ෆෝන් කවර | 01 |
| 198. | 59066 | අත් ඔරලෝසු (කාන්තා) | 01 |
| 199. | 59067 | විදුලි පන්දම | 01 |
| 200. | 59069 | ප්ලාස්ටික් වතුර බෝතල | 01 |
| 201. | 59076 | වලලු ඇසුරුම | 01 |
| 202. | 59077 | සෙල්ලම් ලොරිය | 01 |
| 203. | 59078 | ෆොන් කවර | 01 |
| 204. | 59079 | ෆෝන් චාර්ජර්ස් | 01 |
| 205. | 59080 | ඇඟළුම් අඩංගු පාර්සල | 01 |
| 206. | 59081 | ටී ෂර්ට් | 01 |
| 207. | 59085 | ප්ලාස්ටික් භාණ්ඩ | 01 |
| 208. | 60110 | කොහුබ්‍රෂ් | 01 |
| 209. | 60111 | ජල කරාම | 01 |
| 210. | 60112 | පෙන්සිල්කේස් | 01 |
| 211. | 60113 | ප්ලාස්ටික් භාණ්ඩ | 01 |
| 212. | 60453 | ප්ලාස්ටික් බෝතල් | 01 |
| 213. | 66397 | ළමා ගවුම් | 01 |
| 214. | 66398 | ළමා කලිසම් | 01 |
| 215. | 66400 | රෙදි නූල් බෝල | 01 |
| 216. | 66405 | විදුලි පන්දම් | 01 |
| 217. | 66406 | පෙරනය | 01 |
| 218. | 44127 | ජංගම දුරකථන | 01 |
| | B 168/11 | | |
| 219. | 44218 | 1. ජංගම දුරකථන | 01 |
| | B171/11 | 2. මිදි පොකුරු | 01 |
| | | 3. පිහිය | 01 |
| | | 4. ප්ලාස්ටික් ආවරණ කීපයක් | - |
| 220. | AR 929/14 | 1. MS 319 WB 783 දරන කැඩීගිය කොම්පියුටර් | 01 |
| | | 2. අංක 30311112 දරන කැඩීගොස් ඇති රූපවාහිනී ටියුබය | 01 |
| 221. | 66491 | උදලු | 01 |
| 222. | AR 768/09 | 1. අත් කියත් | 01 |
| | | 2. පිහි | 03 |
| 223. | AR 48/06 | 1. එල් අයරින් | 02 |
| | | 2. පට්ටන් | 02 |
| 224. | AR 828/10 | යකඩ කූරු | 01 |
| 225. | AR 827/11 | දරණ කම්බි කූරු | 01 |
| 226. | AR 1506/10 | මාලු පිහි | 01 |
| 227. | අංක රහිත | උදලු | 18 |
| 228. | 46822 | 1. ලංකා බෙල් දුරකථන | 01 |
| | B 904/11 | 2. කැමරා | 01 |
| | | 3. කැසට් යන්ත්‍ර | 01 |
| 229. | 65674 | වයර් 15 හා වයර් කෝඩ් | 01 |
| 230. | 65695 | වීල් බැරෝ | 01 |
| | B 59/15 | | |
| 231. | 53871 | පිහියා | 01 |
| | B 283/12 | | |
| 232. | 64439 | 1. යකඩ ගිර | 01 |
| | B 719/14 | 2. යකඩ කැති තල | 01 |
| | | 3. වානේ මිටි | 01 |
| 233. | 19819 | පිහියා | 02 |
| | B 1245/08 | | |
| 234. | 54936 | ජංගම දුරකථන | 01 |
| 235. | 53879 | ජංගම දුරකථනය | 01 |
| 236. | 51840 | 1. අලවංගු | 01 |
| | B 527/12 | 2. යකඩ බාල්දි | 01 |
| | | 3. උදලු | 02 |
| | | 4. ග්‍රිල් | 01 |
| | | 5. කුඩා ජෙනරේටර් | 01 |
| 237. | 46102 | 1. උදලු | 01 |
| | B 823/12 | 2. පොරව | 01 |
| | | 3. යකඩ ඉනි | 02 |
| 238. | 45079 | 1. අලවංගු | 02 |
| | B 763/11 | 2. යකඩ කටු | 03 |
| | | 3. උදලු | 03 |
| | | 4. පිකැස් | 01 |
| | | 5. කුළුගෙඩි | 01 |
| | | 6. කොහුලණු | 01 |
| 239. | 46710 | පොරව | 01 |
| 240. | 35893 | ගැල්වනයිස් බට | 11 |
| 241. | අංක රහිත | බෝතල් තොගයක් | - |
| 242. | අංක රහිත | බැරල් තොගයක් | - |
| 243. | අංක රහිත | ප්ලාස්ටික් ඇසුරුම් | 50 |
| 244. | අංක රහිත | බූලි තොගයක් | - |
| 245. | 60736 | තාච්චි | 01 |
| 246. | 66910 | සවල | 01 |
| 247. | 66874 | 1. මුළු මට්ටම | 01 |
| | B 355/15 | 2. පීරි | 06 |
| | | 3. පිහිය | 01 |
| 248. | 49336 | 1. කුළුගෙඩි | 01 |
| | B 107/12 | 2. ගල් කටු | 02 |
| | | 3. පිකැස් | 01 |
| | | 4. කුළුගෙඩි | 01 |
| | | 5. තාච්චි | 01 |
| | | 6. මිටි | 02 |
| 249. | 41994 | 1. වාහන බැටරි | 01 |
| | B 1478/10 | 2. කටර් අඬු | 01 |
| | | 3. ස්පැනර් | 01 |
| | | 4. ස්කුරුප්පු නියන | 01 |
| | | 5. කම්බිකූරු | 01 |
| | | 6. උදලු | 01 |
| | | 7. යකඩ ඉනි | 01 |
| | | 8. ඉදල | 01 |
| 250. | 33634 | කැති | 01 |
| | B 1441/09 | | |
| 251. | 55120 | පොරව | 01 |
| | B 17/12 | | |
| 252. | 48408 | පොරව | 01 |
| 253. | 48825 | පොරව | 01 |
| 254. | 47465 | 1. උදලු | 02 |
| | B 120/11 | 2. යකඩ ඉනි | 01 |
| | | 3. මුල්ලු | 01 |
| 255. | 47784 | විදුලි පන්දම් | 01 |
| | B 1187/11 | | |
| 256. | 41228 | 1. යකඩ ඉනි | 01 |
| | B 65/11 | 2. කුළු ගෙඩි | 01 |
| | | 3. ගල්කටු | 01 |
| | | 4. නියන | 01 |
| | | 5. නයිලෝන් ලණු | 01 |
| | | 6. කොහු ලණු | 01 |
| 257. | 84316 | පිහිය | 01 |
| 258. | 60331 | 1. ඇලිස්කටුව | 01 |
| | | 2. බහුකාර්ය පිහිය | 01 |
| 259. | 46513 | 1. ග්‍රයින්ඩර් | 01 |
| | B 931/11 | 2. බිලීපිති | 01 |
| 260. | 52554 | කතුරු | 01 |
| | B 708/12 | | |
| 261. | 49844 | කැති | 01 |
| | B 137/12 | | |
| 262. | 58514 | 1. යකඩ කරඬි | 01 |
| | | 2. පුනීල | 02 |
| 263. | 67372 | වයර් අඩංගු පාර්සල | 01 |
| 264. | 67413 | 1. සවල | 01 |
| | | 2. බාල්දි | 01 |
| 265. | AR 190/05 | කුඩා පොරව | 01 |
| 266. | AR 719/10 | කැති | 01 |
| 267. | 23605 | 1. යකඩ ඉනි | 02 |
| | B 945/09 | 2. බෝරකටු | 02 |
| 268. | 20734 | උදලු | 01 |
| 269. | 67533 | 1. උදලු | 01 |
| | B 436/15 | 2. යකඩ කටු | 01 |
| 270. | 23110 | පොඩි කුකුළා පහන | 01 |
| | B 509/09 | | |
| 271. | 42030 | කුඩා කාන්තා අත් බෑගය | 01 |
| | B 1210/10 | | |
| 272. | 51158 | සින්තා පැදුරු | 01 |
| 273. | 50868 | සින්තා පැදුරු | 01 |
| 274. | 48016 | සින්තා පැදුරු | 01 |
| 275. | 52389 | 1. ස්කුරුප්පු නියන් | 01 |
| | B 583/12 | 2. යතුරු | 01 |
| | | 3. කියත් පටි | 01 |
| 276. | 45733 | අතකොලු | 01 |
| 277. | 46102 | වාහන යතුරු අඩංගු රෙදි උරය | 01 |
| | B 823/11 | | |
| 278. | 60191 | මයික්‍රොමැක්ස් ජංගම දුරකථන | 01 |
| | B 682/13 | | |

| | | | |
|---|---|---|---|
| 279. | 53567 | මයික්‍රොමැක්ස් ජංගම දුරකථන | 01 |
| | B 802/12 | | |
| 280. | 48083 | ජංගම දුරකථන | 01 |
| | B 408/11 | | |
| 281. | 54657 | ජංගම දුරකථන | 01 |
| | B 1011/11 | | |
| 282. | 43350 | ජංගම දුරකථන | 01 |
| | B 561/11 | | |
| 283. | 45022 | මයික්‍රොමැක්ස් ජංගම දුරකථන | 01 |
| | B 643/11 | | |
| 284. | 40088 | 1. ගල්කටු | 01 |
| | B 1278/10 | 2. මිටි | 01 |
| 285. | 33798 | ස්කුරුප්පු නියන් | 01 |
| | B 599/10 | | |
| 286. | 35046 | 1. උල් අඬු | 03 |
| | B 879/10 | 2. ස්කුරුප්පු නියන් | 01 |
| 287. | 21298 | හෙල්මට් | 01 |
| | B 468/09 | | |
| 288. | AR 807/10 | කැටයම් ලී පෙට්ටිය | 01 |
| 289. | 58802 | 1. යකඩ පට්ටම් | 01 |
| | B 557/13 | 2. අඟලේ යකඩ බට | 01 |
| 290. | 64484 | උදලු | 01 |
| | B 462/13 | | |
| 291. | 49557 | 1. උදලු | 03 |
| | B 159/12 | 2. පිකැස් | 01 |
| | | 3. අලවංගු | 01 |
| | | 4. තංගුස් ලණු | 02 |
| | | 5. උදලු මිටි | 02 |
| | | 6. ප්ලාස්ටික් කෝප්ප | 01 |
| 292. | AR 824/09 | වතුර මෝටර් | 01 |
| 293. | AR 114/09 | වතුර මෝටර් | 01 |
| 294. | 88309 | 1. ජංගම දුරකථන | 10 |
| | B 745/06 | 2. ජංගම දුරකථන බැටරි | 27 |
| | | 3. චාජර් | 08 |
| | | 4. ජංගම දුරකථන පටි | 95 |
| | | 5. ජංගම දුරකථන හවුසින් | 10 |
| 295. | 62348 | උදලු | 01 |
| 296. | 63579 | කැති | 01 |
| 297. | 63936 | කැති | 01 |
| 298. | 65524 | පොරව | 01 |
| 299. | 30674 | 1. ත්‍රිවිල් පටි | 01 |
| | B 96/10 | 2. යකඩ බට කැබලි | 01 |
| 300. | 40144 | 1. පොරව | 01 |
| | B 233/10 | 2. කම්බි කූරු | 01 |
| 301. | 43986 | නොකියා ජංගම දුරකථන | 01 |
| | B 1427/10 | | |
| 302. | 42029 | කැති | 01 |
| | B 878/10 | | |
| 303. | 43183 | උදලු | 01 |
| | B 318/11 | | |
| 304. | 45321 | නිල්පාට හෙල්මට් | 01 |
| | B 171/11 | | |
| 305. | 46186 | පිහිය | 01 |
| | B 605/11 | | |
| 306. | 46921 | පිහිය | 01 |
| | B 360/11 | | |
| 307. | 46977 | රතුපාට හෙල්මට් | 01 |
| | B 758/11 | කලුපාට හෙල්මට් | 01 |
| 308. | 47873 | පිහිය | 01 |
| | B 1196/11 | | |
| 309. | 46545 | කලු පාට හෙල්මට් | 01 |
| | B 396/11 | | |
| 310. | 48595 | 1. අලවංගු | 01 |
| | B 1248/11 | 2. පීරි | 01 |
| | | 3. ස්කුරුප්පු නියන් | 01 |
| | | 4. නයිලෝන් ලණු | 01 |
| | | 5. චේන්සෝ කවර | 01 |
| 311. | 44415 | යතු කැටය | 01 |
| | B 392/11 | අත් කියත් | 01 |
| 312. | 48080 | පිහිය | 01 |
| | B 209/11 | | |
| 313. | 68208 | සවල් | 01 |
| 314. | 36634 | වාහන පැතිකණ්නාඩි | 05 |
| | B 358/10 | | |
| 315. | 43156 | චේන්සෝව | 01 |
| | B 395/11 | | |
| 316. | 62198 | සෙල්ලම් බෝල | 01 |
| 317. | 62196 | පාපිස්ස | 01 |
| 318. | AR 558/14 | බැටරිය රහිත නොකියා ජංගම දුරකථනය | 01 |
| 319. | AR 353/14 | කුඩා කාන්තා අත් බෑගය | 01 |
| 320. | AR 355/14 | ඉරි තැලී ඇති ඇපල් වර්ගයේ ජංගම දුරකථනය | 01 |
| 321. | 62157 | සිවුරු | 02 |
| | B 381/114 | | |
| 322. | 20933 | මේස පිහි | 01 |
| | B 985/108 | | |
| 323. | 68378 | සවල් | 02 |
| 324. | 68529 | උදලු | 01 |
| 325. | 66800 | පොරව | 01 |
| 326. | 48506 | අංක 67 - 3430 දරන ට්‍රැක්ටර් ටේලරය | 01 |

02-257

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - හොරණ**

නඩු භාණ්ඩ වෙන්දේසිය

හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කර ඇති මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2016.02.27 වැනි සෙනසුරාද දින පෙ. ව. 10.00 ට හොරණ මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත සඳහන් නඩු භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර ගැණුම්කරුවන්ට පරීක්ෂා කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරන ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි අදල භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියෙන් මිලට ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරවා ගත යුතු අතර ගෙවීම් මුදල් මගින් පමණක් සිදු කළ යුතු ය.

මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත්කළ යුතු ය.

භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ලෝචනී අබේවික්‍රම වීරසිංහ,
මහෙස්ත්‍රාත් අධිකරණය,
හොරණ.

2016 ජනවාරි මස 18 වැනි දින,
හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2015 වෙන්දේසිය**

| | නඩු අංකය | | භාණ්ඩය | |
|---|---|---|---|---|
| 01. | 5076/15 | (i) | ඇදුම් උදළු | 02 |
| | | (ii) | යකඩ බාල්දි | 01 |
| | | (iii) | ගැරුම් වට්ටි | 02 |
| 02. | 96197 | (i) | උදළු | 01 |
| | | (ii) | පනිට්ටු | 01 |
| 03. | 21569 | (i) | උදළු | 01 |
| | | (ii) | සුදු පාට කොරහා | 01 |
| 04. | 2031/14 | (i) | මිට සහිත උදළු | 01 |
| | | (ii) | සුදු පාට ප්ලාස්ටික් බාල්දි | 01 |
| 05. | 80967 | (i) | සුදු පාට බාස්කට් | 01 |
| | | (ii) | පිහි | 01 |
| 06. | 9089/15 | (i) | බට කුඩ | 01 |
| | | (ii) | පොඩි බාස්කට් | 02 |
| 07. | 6304/15 | (i) | ලොරි ටියුබ් | 01 |
| | | (ii) | ගැරුම් වට්ටි | 02 |
| 08. | 84651 | | මන්නා පිහි | 01 |
| 09. | 2916/15 | (i) | ඇලිස් කටු | 01 |
| | | (ii) | කටර් අඬු | 01 |
| | | (iii) | යකඩ ලීවර් | 01 |
| 10. | 9659/15 | (i) | අඬු මිටි, කටර් අඬු | 01 |
| | | (ii) | ස්කුරුප්පු නියන් | 01 |
| | | (iii) | ස්කේපර් | 01 |
| | | (iv) | අඬු මිටි | 01 |
| | | (v) | උල්කටු | 01 |
| | | (vi) | ඇලිස්කටු | 01 |
| | | (vii) | මන්නාපිහි | 01 |
| | | (viii) | මිට සහිත නියන් | 01 |
| | | (xi) | ස්කුරුප්පු නියන් | 04 |
| | | (x) | ග්‍රිල් කටු | 03 |
| | | (xi) | කටර් අඬු | 03 |
| | | (xii) | කියත්තල | 07 |
| | | (xiii) | ස්පැන්ඩර් | 01 |
| „ | | (xiv) | රින්චි යතුරු | 04 |
| | | (x) | ඇට්ලස් වර්ගයේ ග්‍රිල් මැෂින් | 01 |
| | | (xi) | බ්ලැක් ඇන්ඩ් ඩෙකර් වර්ගයේ ලී කැටයම් කපන මැෂින් | 01 |
| | | (xii) | ෆෝන් චාජර් | 02 |
| | | (xiii) | මයික්ක්‍රෝ මැක්ස් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 11. | 9762/155 | (i) | අත්කියත් | 01 |
| | | (ii) | නියන් | 01 |
| | | (iii) | අතකොළු | 01 |
| 12. | 11498/04 | (i) | අත් කියත් | 01 |
| | | (ii) | අඬු මිටි | 01 |
| | | (iii) | මිනුම් පටි | 01 |
| 13. | 97520 | | ලී මිට සහිත කැති | 01 |
| 14. | 89703 | | විදුලි පන්දම | 01 |
| 15. | 10151/15 | | LED රිචාජබල් විදුලි පන්දම් | 01 |
| 16. | 7459/15 | | ස්පීකර් | 02 |
| 17. | 2077/15 | | සරනේරු | 18 |
| 18. | 8100/15 | | සවල් | 02 |
| 19. | 12507/15 | | සවල් | 01 |
| 20. | 6760/15 | (i) | බාල්දි | 02 |
| | | (ii) | සවල් | 01 |
| 21. | 10514 | (i) | යකඩ බාල්දි | 04 |
| | | (ii) | පොඩි බාල්දි | 02 |
| | | (iii) | සවල් | 01 |
| 22. | 11960/15 | (i) | උදලු | 01 |
| | | (ii) | සවල් | 01 |
| | | (iii) | බාල්දි | 01 |
| 23. | 1111/14 | | බාල්දි | 01 |
| 24. | 95264 | | පැදුරු | 01 |
| 25. | 10872 | | පැදුරු | 01 |
| 26. | 12510 | | පැදුරු | 01 |
| 27. | 5227/15 | | රතුපාට පින්තාරු පැදුරු | 01 |
| 28. | 648/14 | | පැදුරු | 01 |
| 29. | 1793/14 | | පැදුරු | 01 |
| 30. | 12232 | | පැදුරු | 01 |
| 31. | 87227 | | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 32. | AR 122/15 | | පිලිප්ස් වර්ගයේ කළුපාට ජංගම දුරකථනය | |
| 33. | AR 123/15 | | ෆෝම් වර්ගයේ ජංගම දුරකථනය | |
| 34. | AR 1143/15 | | CELKON වර්ගයේ ජංගම දුරකථනය | |
| 35. | 81786 | (i) | යකඩ ඉණි | 01 |
| | | (ii) | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 36. | 47533 | | ඩී. වී. ඩී. යන්ත්‍රය හා දුරස්ථ පාලකය | 01 |
| 37. | 53433 | | සිංගර් වතුර මෝටර් | 01 |
| 38. | 44294 | | වතුර මෝටර් | 01 |
| 39. | 81703 | (i) | බෙහෙත් ඉසින යන්ත්‍ර | 01 |
| | | (ii) | කුලු ගෙඩි | 01 |
| 40. | 89873 | (i) | ලාෆ් ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 41. | 11552 | (i) | ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | ගෑස් ලිප් | 01 |
| 42. | 83245 | | ගෑස් සිලින්ඩර | 01 |
| 43. | 87619 | | ගෑස් සිලින්ඩර | 01 |
| 44. | 3946/15 | (i) | ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | ගෑස් ලිප් | 01 |
| 45. | 8053/15 | (i) | ලාෆ් ගෑස්සිලින්ඩර | 01 |
| | | (ii) | ගෑස්ලිප් | 01 |
| 46. | 3852/04 | | කහ පාට ගෑස් සිලින්ඩර | 01 |
| 47. | 7707/15 | (i) | නිල් පාට ලිට්‍රෝ ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | ගෑස් ලිප් | 01 |
| 48. | 5696/15 | (i) | කහ පාට ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | යකඩ ගෑස් ලිප් | 02 |
| | | (iii) | ගෑස් ලිප් රඳවන ස්ටෑන්ඩ් | 02 |
| 49. | 10350 | | ගෑස් ලිප් | 01 |
| | 82540 | (i) | ගෑස් සිලින්ඩර | 01 |
| | | (ii) | රෙගියුලේටරය සහිත කළුපැහැ බට | 01 |
| | | (iii) | වට හතරකින් යුත් ගෑස් ලිප | 01 |
| 50. | 10112/15 | | ගෑස් ලිප් | 01 |
| | | | ලාෆ් ගෑස් සිලින්ඩර | 01 |
| | | | බටය සහිත රෙගියුලේටර් | 01 |
| | | | කළු පාට ප්ලාස්ටික් බාල්දි | 02 |
| 51. | 24178 | (i) | ඔක්සිජන් සිලින්ඩර | 01 |
| | | (ii) | රෝස පාට බේසම් | 01 |
| 52. | AR 746/15 | | බෝට්ටුව | 02 |
| 53. | AR 840/14 | | අංක 137 - 2160 දරන යතුරු පැදිය (අබිලි) | |
| 54. | AR 841/14 | | අංක 149 - 9943 දරන යතුරු පැදිය (අබිලි) | |
| 55. | AR 842/14 | | අංක NWPP - 1146 දරන යතුරු පැදිය (අබිලි) | |
| 56. | AR 912/14 | | WPHN - 6087 අංක දරන යතුරු පැදිය (අබිලි) | |
| 57. | AR 120/15 | | අංක 129-2552 දරන යතුරුපැදිය (අබිලි) | |
| 58. | 91207 | | අංක 150 - 4295 සුපර් කප් වර්ගයේ යතුරු පැදිය | |
| 59. | 89108 | | අංක WPGH 2110 දරන යතුරු පැදිය | |
| 60. | 88056 | | අංක WPSE 7605 දරන අත් ට්‍රැක්ටරය | |
| 61. | 98097 | | අංක 75 - 7239 දරන අත් ට්‍රැක්ටරය (අබිලි) | |
| 62. | 5606/15 | | ජනෙල් පියන් | 03 |
| | | | දෙර පියන් | 01 |
| | | | කොස් ලෑලි | 32 |

02-256

---

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - පැල්මඩුල්ල**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පැල්මඩුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදල රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2016.03.05 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් පාන්නෙක් වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක අදාළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. මිළ දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාර නොගැනේ.

07. ගැණුම්කරුවන් තම ජාතික හැදුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

එච්. ජී. ජේ. ආර්. ජනිතා පෙරේරා,
දිසා මහෙස්ත්‍රාත් විනිසුරු සහ,
පැල්මඩුල්ල.

2016 ජනවාරි මස 18 වැනි දින,
පැල්මඩුල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තය |
|---|---|---|
| 01. | AR334/14 | HERO Cycites අංක Ko 1/9960 දරන කළු පැහැති පාපැදිය |
| 02. | AR 332/14 | EXIDE වර්ගයේ අංක 02713 දරන වාහන බැටරිය |
| 03. | AR 336/14 | ගැරුම් වට්ටි 2, කුඩා වේවැල් වට්ටි 2, නයිලෝන් කඹ 01 |
| 04. | AR 335/14 | පොඩි වේවැල් කුඩ 01යි |
| 05. | 28542 | කුඩ 04 |
| 06. | 61096 | ගෑස් සිලින්ඩර් 01යි |
| 07. | 48000 | පොරවක් |
| 08. | 56415 | පිහියක් |
| 09. | 61455 | ජල කරාම 01යි |
| 10. | 63081 | ජල කරාම 01යි |
| 11. | 63805 | ජල කරාම 01යි |
| 12. | 61237 | යකඩ ඇණ කිහිපයක් |
| 13. | 63732 | තීන්ත ටින් 03ක් |
| 14. | 59870 | චේන්සෝ 01ක් |
| 15. | 59299 | පිහි 01ක් |
| 16. | 56277 | ඇඳුම් උදළු 02යි |
| 17. | 56412 | පෙති යකඩ 01යි |
| 18. | 64735 | ජල කරාම 01යි |
| 19. | AR 328/15 | වතුර මෝටර් 02යි (ජලයේ ගිල්වන) හෝස්බට කොටසක් හා විදුලි වයර් කොටසක් |
| 20. | 31549 | රූපවාහිනී යන්ත්‍ර 01යි |
| | | කැසට් යන්ත්‍ර 01යි |
| | | බෆල් 01යි |
| 21. | AR 237/15 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 22. | 48889 | Dokick වර්ගයට අයත් ජංගම දුරකථන 01යි |
| 23. | AR 205/15 | ඇපල් වර්ගයට අයත් ජංගම දුරකථන 01යි |
| 24. | AR 238/15 | ගමන් කථන 01යි |
| 25. | 65088 | වේවැල් කුඩ 01යි |
| 26. | 65085 | උදළු 01යි, යකඩ 02යි |
| 27. | 65414 | ගෑස් ලිප් 01යි, සිලින්ඩර් 01යි |
| 28. | 65616 | ගෑස් ලිප් 02යි |
| 29. | 29438 | චැසි අංක JC 10 - 1000784 එන්ජින් අංක JC 10 E 1000 185 දරන යතුරු පැදිය (කැබලි කර විකිණීම සඳහා) |
| 30. | 76017 | WP GA 4648 දරන හීරෝ හොණ්ඩා වර්ගයේ යතුරු පැදි 01යි |
| 31. | 49758 | අංක SGMD 3502 දරන යතුරු පැදි 01යි |
| 32. | AR/768/12 | අංක SPWE 0038 දරන යතුරු පැදි 01යි |
| 33. | 47621 | SG 7504 අත් ට්‍රැක්ටර් එන්ජින් 01යි |
| 34. | 65869 | ඇදුම් උදළු 03යි, අඟල් 03ක් පළල අඩි 2යි, අඟල් 10ක් දිග යකඩ පතු 01යි |
| | | වේවැල් කුඩ 02යි |
| | | තංගුස් නූල් 02යි |
| 35. | 65765 | බට කුඩ 02යි |
| 36. | 65756 | ගෑස් ලිප් 01යි, සිලින්ඩර් 01යි |
| 37. | AR/495/14 | නිකල් පාට සිටිසන් වර්ගයේ අත් ඔරලෝසු 01යි |
| 38. | - | අබලන් වානේ කබඩ් 01යි |
| 39. | - | පරිගණක පුටු 01යි |
| 40. | - | යතුරුලියන 01යි (ඔලිම්පියා සිංහල) |
| 41. | - | පරිගණක 01යි, සී. පී. යූ. 01 (FC 2 NL 18) |
| | | මොනිටර් 01යි, OG 9393 - 64 180667 - 3006) |
| | | යතුරු පවුරු 01යි |
| 42. | - | මුද්‍රණ යන්ත්‍ර 02යි |
| | | 1. Lexmark E 120 - 995BV 2 H |
| | | 2. Lexmark E 120 - 994B 33 H |
| 43. | - | බෝතල් තොගයක් |
| 44. | - | බූලි තොගයක් |

02-258

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ නදී ආකෂ් කුරේරා වර්ෂ 2015 නොවැම්බර් මස 12 වැනි දින සහතික කරන ලද අංක 7415 ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2015 දෙසැම්බර් ස 08 වැනි දින සිට බල රහිත කරන ලද බව මෙරින් ජගත් අතුකෝරළ වන ම විසින් දන්වා සිටිමි.

02-225

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ෆෙයාර්වේ අර්බන් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2015 සැප්තැම්බර් මස 16 වැනි දින
සමාගමේ අංකය : පී වී 108431
ලියාපදිංචි ලිපිනය : අංක 100, බුත්ගමුව පාර, රාජගිරිය

අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂක.

02-249

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : මයිතිසිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2015 ඔක්තෝබර් මස 14 වැනි දින
සමාගමේ අංකය : පී වී 109099
ලියාපදිංචි ලිපිනය : අංක 100, බුත්ගමුව පාර, රාජගිරිය

අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂක.

02-250

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ප්‍රයෝරිටි ඉන්වෙස්ට්මන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2015 ජූලි මස 08 වැනි දින
සමාගමේ අංකය : පී වී 106839
ලියාපදිංචි ලිපිනය : අංක 100, බුත්ගමුව පාර, රාජගිරිය.

අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂක.

02-251

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : එම්. එස්. ඉම්පෝට් ඇන්ඩ් එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2015 දෙසැම්බර් මස 04 වැනි දින
සමාගමේ අංකය : පී වී 110246
ලියාපදිංචි ලිපිනය : අංක 257/4, ටොරිංටන් මාවත, කොළඹ 05

අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂක.

02-252

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ඇපරල් වෙබ් ටු තවුසන්ඩ් ඇන්ඩ් ෆිෆ්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 01 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඇපරල් වෙබ් ටුතවුසන්ඩ්ඇන්ඩ්ෆිෆ්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104897
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 78, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ - සර්වි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-261

---

## දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඔරිට්ස් ෆෝ බ්‍රෑන්ඩඩ් ලයිෆ් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 50, කොළඹ පාර, ගම්පහ
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 110682
සංස්ථාගත කළ දිනය : 2015.12.22

ලේකම්.

02-262

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ෂයින් ටී හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110898
ලියාපදිංචි දිනය : 2015.12.30
ලියාපදිංචි ලිපිනය : අංක 11ඒ, 1 වැනි පටුමග, පාගොඩ පාර, නුගේගොඩ.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල.

02-275

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බටුවත්ත, ''හර්ෂ'' හි පදිංචි රන්වලගේ දේවප්‍රිය චන්ද්‍රසේකර පෙරේරා විසින් එස්. එස්. රේෂිකා රුවනි ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2015ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින ගණේමුල්ලේ දී අත්සන් කරන ලද අංක 461 දරන ඇටර්නි බලපත්‍රයෙන් ගණේමුල්ල, කිරිඳිවිට පාර, අංක 435 හි පදිංචි රන්වලගේ ප්‍රියංගිකා රන්වල හෙවත් රන්වලගේ ප්‍රියංගිකා රන්වල විජයගුණවර්ධන වන මට ලබාදෙන ලද ඇටර්නි බලපත්‍රය අවලංගු කරන බව සියලුදෙනාම දැන ගැනීම පිණිස මින් ප්‍රකාශ කරමි.

02-277

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බටුවත්ත ''හර්ෂ'' හි පදිංචිව සිට දැනට ඕස්ට්‍රේලියාව, 2154, නිව් සවුත් වේල්ස්, කාසල් හිල්, කාසල් වීදිය, අංක 18/59ඒ හි පදිංචි සජීව් නිරෝෂ පෙරේරා රන්වල විසින් ඕස්ට්‍රේලියාවේ, සොලිසිටර් රුවන් පී. සමරසිංහ විසින් වර්ෂ 2011 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින ඕස්ට්‍රේලියාවේ දී අත්සන් කරන ලද ඇටර්නි බලපත්‍රයෙන් බටුවත්ත, පාසල පාර, ''හර්ෂ'' හි පදිංචි ජා. හැ. ප. අංක 333050277 V හිමි රන්වලගේ දේවප්‍රිය චන්ද්‍රසේකර පෙරේරා යන අයට ලබාදෙන ලද ඇටර්නි බලපත්‍රය අවලංගු කරන බව සියලුදෙනාගේම දැන ගැනීම පිණිස මින් ප්‍රකාශ කරමි.

02-278

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දිමුතු නානායක්කාර මහත්මිය විසින් වර්ෂ 2013ක් වූ ජූලි මස 13 වැනි දින ලියා සහතික කරන ලද අංක 564 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් හෙයියන්තුඩුව, මාබිම, අංක 174/4 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 665080820 V හිමි මහපටුනගේ ඉන්ද්‍රා පද්මසීලි යන අයව හෙයියන්තුඩුව, දේවමිත්ත පෙදෙසේ, අංක 271/ඒ/3 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 645871391 V හිමි මහපටුනගේ දෝන ලලිතා පද්මිණී වන මා විසින් ඉහත කී මහපටුනගේ ඉන්ද්‍රා පද්මසීලි යන අයව පත්කළ එකී පත්වීම මා මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ජනරජයේ සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඩී. ලලිතා පද්මිණී.

02-279

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සෙන්ට්. ෆ්‍රැන්සිස්කෝ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.12.22
සමාගමේ අංකය : පී වී 110585
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 124, කොළඹ පාර, පලාවි, පුත්තලම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

පී. ඊ. චම්පික රුද්‍රිගෝ,
සමාගම් ලේකම්.

දුරකථන අංක : 0772205857

02-280

---

## ඩීජීඑස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය යටතේ ප්‍රාග්ධනය අවකරණය කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

සමාගමේ නම : ඩීජීඑස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 11597
සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 165/7, උද්‍යාන පාර,
කොළඹ 5
ප්‍රාග්ධනය අවකරණය කිරීමට පෙර වටිනාකම : රු. 50,000,000
ප්‍රාග්ධනය අවකරණය කිරීමට පසු වටිනාකම : රු. 20
ප්‍රාග්ධනය අවකරණය කරන වටිනාකම : රු. 49,999,980

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂ,
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

02-298

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ පෙර නම : ස්ටෙරෙඩියන් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්)
ලිමිටඩ්
සමාගමේ අලුත් නම : ස්ටෙරෙඩියන් කැපිටල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් වූ දිනය : 2016.01.19
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 91493
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : කොළඹ 01, එචලන් චතුරශ්‍රය, ලෝක
වෙළඳ මධ්‍යස්ථානය, නැගෙනහිර
කුළුණ, 16 වන තලය හි අංක 16 - 03 හි යන ස්ථානයේ බව අපි මෙයින්
මහජනතාවට දැනුම් දෙමු.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂ.
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු),

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

02-299

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රා/ලේ කොට්ඨාසයේ කොස්කොළවත්ත, මල්වල රත්නපුර ලිපිනයේ පදිංචි ජා. හැ. ප. අංක 708441899 V දරන ගොළුකන්දලාගේ උදයංගනී රාමදාස වන මා විසින් රත්නපුර, කොස්පැලවින්න 123/2 ලිපිනයේ පදිංචි ජා. හැ. ප. අංක 603520556 V දරන ගොළුකන්දලාගේ රාහුල රාමදස යන අය වෙත ඇටෝර්නි බලතල පවරමින් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ බලයලත් නිළධාරී එච්. ජී. යූ. පුෂ්පකුමාර මහතා ලවා 2008 ජනවාරි මස 11 වැනි දින සහතික කරන ලද සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ඌව සබරගමුව කලාප කාර්යාලයෙහි 3 වන කාණ්ඩයේ 106 පත්ඉරුවේ දිනපොත් අංක 78 යටතේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2016 ජනවාරි මස 12 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මින් ඉදිරියට එකී බලපත්‍රය මගින් කරන යම් ක්‍රියාවකට හෝ ගනුදෙනුවට මම වගකීම් නොදරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

මෙයට,
ගොළුකන්දලායේ උදයංගනී රාමදාස.

2016 ජනවාරි 12 වැනි දින.

02-304

---

## පුද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : කොන්කෝඩ් ලෙෂර් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 103081
ලියාපදිංචි දිනය : වර්ෂ 2014ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 415/ඒ, 10-2, තුන්වන පටුමග, වානගුරු මාවත,
හෝකන්දර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සම්පත් චාමින්ද ගමගේ,
සමාගම් ලේකම්.

02-308

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : එස්. ජී. එම්. මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 110182
ලියාපදිංචි කළ දිනය : 2015.12.02
කාර්යාල ලිපිනය : අංක 163/15, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

02-309

---

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

රාගම, තේවත්ත පාර, ලූර්දු මාවත, අංක 556, දරන තැන පදිංචි ගොරකගහවත්තගේ ප්‍රමිලා ගීතානි ගොරකගහවත්ත (ජා. හැ. අංක 725314507 වී) වන මා විසින් කටුනේරිය, ලංසිගම, ලදනි මාවත, අංක 61 - 1 සී දරන තැන පදිංචි දඹගේ කලැරන්සි වසන්ත ප්‍රනාන්දු (ජා. හැ. අංක 752691304 වී) යන අයට දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් ටී. ජේ. නලවංශ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 12409 සහ 2013.06.01 දිනැති ඇටර්නි බලපත්‍රය 2016.01.29 දින සිට මා විසින් අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

02-319

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගුරුතලාව, සත්මල් වතුයායේ දැනට පදිංචි (පෙර කරගස්තැන්න, සත්මල් වතුයාය දරන ස්ථානයේ සහ කරගස්තැන්න, සත්මල් වතුයාය, අංක 214 දරන ස්ථානයේ පදිංචිව සිටි) ඩැනියල් ඇන්තනි ෆෙයාර්වෙදර් (ජා. හැ. අංක 720850893 X) වන මා විසින්,

01. කොළඹ 06, එඩ්මන්ටන් පාරේ, අංක 36/55 දරන ස්ථානයේ පදිංචි චන්දන පුංචිහේවා (ජා. හැ. අංක 671210832 V) යන අය වෙත බලය පවරන ලද බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් බී.එම්. බී. ආර්. කේ. බස්නායක විසින් ලියා සහතික කරන ලද අංක 325 සහ 2011.07.29 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය, සහ

02. කඩුවෙල, වැලිවිට, පල්ලිය පාරේ, අංක 145 දරන ස්ථානයේ පදිංචි මාතරගේ දෙන් ආනන්ද හෙවත් ලිව්ලින් ජේම්ස් කවිරත්න (ජා. හැ. අංක 511863430 V) යන අය වෙත බලය පවරන ලද බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. බී. ආර්. කේ. බස්නායක විසින් ලියා සහතික කරන ලද අංක 324 සහ 2011.07.29 වැනි දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය,

මෙහි දින සිට අවලංගු කර අහෝසි වන අතර, ඒවායේ බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ඩැනියල් ඇන්තනි ෆෙයාර්වෙදර්.

2016 ජනවාරි මස 16 වැනි දින.

02-344

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 320 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි

මියුචුවල් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 10370
සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඈවර කිරීම

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඈවර කිරීමක් වශයෙන් මෙම සමාගම ඈවර කිරීමටත්, කොළඹ 2, වොක්ෂෝල් වීදියේ, අංක 141/3 දරන ස්ථානයේ වරලත් ගණකාධිකාරී රාජපක්ෂ පතිරන්නැහැලාගේ වසන්ත චමින්ද රාජපක්ෂ මහතා සමාගමේ ඈවරකරු වශයෙන් වර්ෂ 2016ක් වූ පෙබරවාරි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීමටත්, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, 141/3 දරන ස්ථානයේ දී වර්ෂ 2016ක් වූ පෙබරවාරි මස 02 වැනි දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී යෝජනා සම්මතයක් අනුමත කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 319 (1) (ආ) දරන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. පී. ඩබ්ලිව්. සී. රාජපක්ෂ,
ඈවරකරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

02-345/1

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි

මියුචුවල් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 10370
ඈවරකරුවකු පත්කිරීමේ නිවේදනය

වර්ෂ 2016ක් වූ පෙබරවාරි මස 02 වැනි දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී මියුචුවල් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඈවරකරු වශයෙන් සමාගමේ විශේෂ යෝජනා සම්මතයෙන් මා පත් කරන ලද බව කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 141/3 දරන ස්ථානයේ වරලත් ගණකාධිකාරී රාජපක්ෂ පතිරන්නැහැලාගේ වසන්ත චමින්ද රාජපක්ෂ වන මම මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. ඩබ්ලිව්. සී. රාජපක්ෂ,
ඈවරකරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

02-345/2

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2015.10.20 වැනි දින ලියා සහතික කළ අංක 118 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටර්නි බලකරු ලෙස බත්තරමුල්ල වික්‍රමසිංහපුර, 9 වැනි පටුමග, අංක 51/10 සී, යන ලිපිනයෙහි පදිංචි බුලත්වත්තේ වලව්වේ කිත්සිරි නිෂාද් දිසානායක වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 118 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලුදෙනා වෙත මෙයින් දන්වමු.

02-338

### ඇටෝර්නි බලය අහෝසි කිරීමයි

අංක 14, එලියට් පෙදෙස, කොළඹ 08 හි 303130322 V යන ජා. හැ. ප. අංක දරන අක්මීමන විදන ආරච්චිගේ සුමනපාල වෙත අංක 14, එලියට් පෙදෙස, කොළඹ 08 හි 581333013 V යන ජා. හැ. ප. අංක දරන ප්‍රීති සුදර්ශන ගාමිණී අක්මීමන වන මා විසින් ලබා දී තිබූ හා 75 සී, අම්බලන්වත්ත පාර, හීනටිකුඹුර තලංගම උතුර හි බලයලත් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. අතුකෝරාල විසින් සහතික කරන ලද අංක 1223 දරන 2007 දෙසැම්බර් මස 21 දිනැති ඇටර්නි බලය මෙදින පටන් අහෝසි කොට, අවලංගු කොට, අභිශූන්‍ය කරන ලද බවත්, මෙතැන් පටන් මා වෙනුවට එකී අක්මීමන විදන ආරච්චිගේ සුමනපාල විසින් එළඹෙන කිසිදු ගනුදෙනුවකට මා විසින් කිසිදු වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි වෙසෙන පොදු මහ ජනයාටත් කෙරෙන දැනුම් දීමයි.

02-376

---

### ඇටෝර්නි බලය අහෝසි කිරීමයි

අංක 14, එලියට් පෙදෙස, කොළඹ 08 හි 303130322 V යන ජා. හැ. ප. අංක දරන අක්මීමන විදන ආරච්චිගේ සුමනපාල වෙත අංක 14, එලියට් පෙදෙස, කොළඹ 08 හි 665581098 V යන ජා. හැ. ප. අංක දරන මෙරිඤ්ඤගේ උදිතා ප්‍රියදර්ශනී කොස්තා වන මා විසින් ලබා දී තිබූ හා 75 සී, අම්බලන්වත්ත පාර, හීනටිකුඹුර, තලංගම උතුර හි බලයලත් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. අතුකෝරළ විසින් සහතික කරන ලද අංක 1222 දරන 2007 දෙසැම්බර් මස 21 දිනැති ඇටර්නි බලය මෙදින පටන් අහෝසි කොට, අවලංගු කොට, අභිශූන්‍ය කරන ලද බවත්, මෙතැන් පටන් මා වෙනුවට එකී අක්මීමන විදන ආරච්චිගේ සුමනපාල විසින් එළඹෙන කිසිදු ගනුදෙනුවකට මා විසින් කිසිදු වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි වෙසෙන පොදු මහ ජනයාටත් කෙරෙන දැනුම් දීමයි.

02-377

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම්

සමාගමේ නම : ට්‍රයිබ් ඔෆ් කර්ම (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 111018
ලියාපදිංචි කළ දිනය : 2016 ජනවාරි මස 19 වැනිද
ලියාපදිංචි කාර්යාලය : අංක 42/7, කහටගහවත්ත, වැවල, හික්කඩුව.

02-378

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ස්කයිලයින් එන්ටර් ටේන්මන්ට් ඇන්ඩ් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 109202
ලියාපදිංචි දිනය : 2015.10.26
ලියාපදිංචි ලිපිනය : අංක 66, කලල්ගොඩ පාර, කලල්ගොඩ, පන්නිපිටිය.

සමාගම් ලේකම්.

02-384

### 2007 අංක 7 දරන සමාගමේ පනත දැන්වීමයි

සකුරා ලංකා හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 111005

ඉහත සඳහන් සමාගම 2016 ජනවාරි මස 05 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 460/බී 4, වැලි පාර, තලවතුගොඩ ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමි.

ඩබ්. ඒ. එස්. එස්. වීරසිංහ මහතා,
අධ්‍යක්ෂක.

02-386

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර, හාෆ් ලයිෆ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015 දෙසැම්බර් මස 15 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : හාෆ් ලයිෆ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110520
ලියාපදිංචි කාර්යාලය : අංක 159, ශ්‍රී සද්ධර්ම මාවත, කොළඹ 10

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

02-390

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඉන්දියාව, චෙන්නායි - 600101, ඇන්නන්ගර් වෙසට් එක්ස්ටෙන්සන් ප්ලොට් අංක 484 හි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම, පනාගොඩ, ටෙම්ප්ල්බර්ග් කර්මාන්තපුර දෙවන අදියර, ලොට් අංක 1 හි පිහිටි සීමාසහිත සින් ස්ටීල්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි බජීර් සින් (ඉන්දියන් ගමන් බලපත්‍ර අංක Z 2737376) වන මම, මා විසින් මීගොඩ, ශ්‍රී ගුණානන්ද මාවත, අංක 323, ''සමන්'' හි පදිංචි බුලත්සිංහලගේ දක්ෂිණ දේවින්ද කුරේ යන අයව මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරන ලද බී. එස්. බී. කුරේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද අංක 19441 හා 2015.01.05 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන බවට ද, ශූන්‍ය හා බලරහිත කරන බවට ද, එකී ඇටෝර්නි බලපත්‍රයෙන් ඔහුට ලබා දී ඇති සියලුම බලතල හා අධිකාරයන් හා එහි අඩංගු සියලුම කාර්යයන් අද දින සිට අහෝසි වන බවට ද, සියලු දෙනාට ම මෙයින් දැනුම් දෙනු ලැබේ.

බජීර් සින්.

2016 ක් වූ ජනවාරි මස 23 වැනි දින දී ය.

02-402

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව, පහත සමාගම් සංස්ථාපනය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නම : ලංකා අගාර්වුඩ් ප්ලාන්ටේෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 110381
ලියාපදිංචි කාර්යාලය : 68/60, ඩී. එස්. විජේසිංහ මාවත, කටුබැද්ද, මොරටුව
ලියාපදිංචි කළ දිනය : 2015.12.09

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු පී වී 259.

02-431

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

බඩල්ගම, කෙහෙල්ඇල්ල අංක 70 සී, දරන ස්ථානයේ පදිංචි දිනේෂ් චන්දන එදිරිවීර හැ. ප. අංක 822782485 V හිමි අය විසින්, වර්ෂ 2013.11.20 වැනි දින, ෂර්ලි අමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් සහතික කරන ලද අංක 27798 දරන ඇටෝර්නි බලපත්‍රයෙන්, කොළඹ 13, මහා විද්‍යාලය මාවත, අංක 56/32 හි, හැ. ප. අංක 542862297 V හිමි, මොහමඩ් රෂීඩ් මොහමඩ් නජීබ් වෙත පවරන ලද එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවට ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් දැනුම් දෙනු ලැබේ.

02-434

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

ආයතනවල නම් : ඩිස්ටිලරිස් ඕෂනා (ප්‍රයිවට්) ලිමිටඩ්
පී වී 110848 - 2015.12.30 ට්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
පීවී 111323 - 2016.01.18
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 06, ඊ. එල්. බී. ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 1

ආයතන ලේකම්වරු.

02-435

---

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

අංගොඩ අවිස්සාවේල්ල පාර, අංක 338/4 දරන ස්ථානයේ පදිංචි ආශා අනුෂා විජේසිංහ ගුණරත්න වන මම ශ්‍රී ලංකා ජනරජයටත් මහ ජනතාවටත් අදාළ සියලු දෙනාටත් මෙයින් දන්වා සිටින වග නම් මා විසින් අත්සන් කර දෙන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. ධර්මරත්නම් මහතා විසින් වර්ෂ 2002 ජූලි 18 වැනි දින සහතික කරන ලද අංක 2140 දරන ඇටර්නි බලපත්‍රයෙන් මාගේ ඇටර්නි බලකරු ලෙස නුගේගොඩ නාවල පාර අංක 177/4 හි පදිංචි ලලිත් රෝහන විදනගමගේ (ජා. හැ. අංක 58276272 V) වෙත දෙන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර / ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

මෙකී දිනයේ පටන් එකී ඇටර්නි බලපත්‍රය යටතේ සිදු කරන කිසිම ක්‍රියාවක් ගනුදෙනුවක් කෙරෙහි මගේ වගකීමක්, බැඳීමක් නොමැති බව දන්වා සිටිමි.

ආශා අනුෂා විජේසිංහ ගුණරත්න.

02-433

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ලංකා බැංකුව

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

කෝට්ටේ, ඇතුල්කෝට්ටේ, 6 වන පටුමගෙහි, 941/28 හි එක්ස්ප්‍රස් මාර්කටින් ඉම්පෙක්ස් නමින් හා විලාසයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන දොලඉහළ කංකානම්ගේ කුලරත්න මාර්ටින් හෙවත් දොළඉහළ කංකානම්ගේ කුලරත්න මහතාගේ වගකීම් වෙනුවෙන් රාජගිරිය, නාවල, වලව්වත්ත, වලව්වත්ත පෙදෙසෙහි අංක 19/1 C හි පිහිටි උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 පෙබරවාරි මස 27 වැනි දිනැති අංක 1904 දරන *ගැසට් පත්‍රයේ* හා 2015 පෙබරවාරි මස 16 වැනි දින ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2016 මාර්තු 04 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 182/3 (50/3) හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 520 දරන නාවල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නාවල පිහිටි වලව්වත්ත පෙදෙසෙහි හි වරිපනම් අංක 19/1C දරන හැඩවකගහවත්ත, කහටගහවත්ත හෙවත් ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් සාදන ලද 1997 නොවැම්බර් මස 22 දිනැති අංක 601 B දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කොටසට මායිම්ව, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : වලව්වත්ත පෙදෙසෙහි අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 1 හි ඉතිරි කොටස ද, දකුණට : පී. ගාල්ලගේගේ අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට : වලව්වත්ත පෙදෙස ද, මායිම් ව එකී අංක 601 B දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම පහක (අ. 0 රූ. 0 පර්. 15.5) ක බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම් කොටස ද ඒ හා බැඳුනු සියලු දේ ද වේ.

ලොට් 2 ලෙස දක්වා ඇති එකී බිම් කැබැල්ල පහත සඳහන් ඉඩම් නැවත මැනීමකි.

එකී නාවල පිහිටි හැඩවකගහවත්ත, කහටගහවත්ත හෙවත් ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් සාදන ලද 1997 ජූලි මස 16 දිනැති අංක 590 දරන පිඹුරෙහි ලොට් A1 නම් ඉඩම් කොටසට මායිම්ව උතුරට : ලොට් A 2 ද, නැගෙනහිරට : පී. ගාල්ලගේගේ අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 1 හි ඉතිරි කොටස ද, දකුණට : එකී අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට : වලව්වත්ත පෙදෙස් ද මායිම්ව එකී අංක 590 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම පහක (අ. 0 රූ. 0 පර්. 15.50) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම් කොටස හා ඒ හා බැඳුනු සියලු දේ ද වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 3064/218 හි ලියාපදිංචි කර ඇත.

(එකී ලොට් 2 හි වර්තමාන වරිපනම් අංකය 23 ය)

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සම්බන්ධතා නිලධාරි,
අයකර ගැනීම් (ආයතනික)

ලංකා බැංකුව,
අයකර ගැනීම් (ආයතනික) ඒකකය,
''ලංකා බැංකු චතුරස්‍රය''
අංක 1, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

සැ. යු. - ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම පළකිරීමෙන් පසුව එක්ස්ප්‍රස් මාකටින් ඉම්පෙක්ස් හි දොළඉහළ කංකානම්ගේ කුලරත්න මාර්ටින් විසින් 2015.03.25 දින රු. 100,000.00 ක මුදලක් තැන්පත් කර ඇති අතර 2015.07.14 දින රු. 500,000.00 ක මුදලක් ද, තැන්පත් කරනු ලදුව එම මුදල අවිනිශ්චිත ගිණුම ණය හිමියෝ හා පවතී.

02-379

---

### ලංකා බැංකුව

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

(1) ණය යොමු අංකය : 70696455, 70882477, 71390241

චෙන්කලඩි, කෙලින් වීදියේ, පදිංචි තංගමුත්තු ජෙයසිංගම් මහතා සහ පුෂ්පලතා ජෙයසිංගම් මියට අයත් චෙන්කලඩි ප්‍රධාන වීදියේ අංක 321 හි පිහිටි ජුගාස් ඇග්‍රෝ ඩෙයරිස් ආයතනයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 ජනවාරි මස 14 දිනැති අංක 1950 දරන *ගැසට් පත්‍රයේ* හා 2016 ජනවාරි මස 4 වැනි දින ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා '' තිනකරන්'' යන පුවත්පත් පළ පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2016 මාර්තු 3 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි ෂොක්මන් සහ සමරවික්‍රම වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමු උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, ඒරාවූර් පත්තුවේ, අංක 01 දරන කොට්ඨාසයේ, ඒරාවූර් නගර ප්‍රාදේශීය සභා සීමාවේ ඒරාවූර් ග්‍රාමයේ ඒරාවූර් 04 හි පිහිටි ත්‍රිකුණාමල පාරේ වරිපනම් අංක 236 දනට වරිපනම් අංක 280 දරන ''නවරෝඩ්ඕරත්තු වලවු'' නමැති ඉඩමෙහි නැගෙනහිර දෙකෙන් පංගුවෙහි නැගෙනහිර කොටසෙහි මැද කොටසින් සෑදී ඇති ඉඩම් කැබැල්ල උතුරට : එම්. අයි. අබ්දුල් හමීඩ්ට සහ එම්. අයි. ඒ. මරියඋම්මාට අයත් ඉඩම ද, නැගෙනහිරට : පටුමග ද, දකුණට : ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තු (PWD) පාර ද, බස්නාහිරට : එම්. ඒ. සාහුල් හමීඩ් සහ එම්. එල්. ඒ. මරියඋම්මාට අයත් ඉඩම ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් දහතරක (අ. 0 රූ. 2 පර්. 14) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති රඟහල ගොඩනැගිල්ල ද, පිටගෙවල්, ළිඳ, G. K. ප්‍රොජෙක්ටරය සහ ආධාරකය ද, පරිපථය සහ යන්ත්‍ර සූත්‍ර, බංකු පුටු සහ වෙනත් උපකරණය ද සමග වේ. මෙය මඩකලපු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 205/253 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු ඒ. සින්නරාජා විසින් සාදන ලද 2008 ඔක්තෝබර් 16 වැනි දිනැති අංක AS/08/EP/711 දරන මැනුම් පිඹුරට අනුව පහත පරිදි විස්තර කර ඇත.

එකී ඒරාවූර් ග්‍රාමයෙහි ඒරාවූර් 4 හි පිහිටා ඇති ''නවරෝඩ්ඕරත්තු වලවු'' නැමති ඉඩමෙහි අංක AS/08/EP/711 දරන එකී පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා නිරූපණය කර ඇති බිම්කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : එකී පිඹුරෙහි ලොට් 1 ද, දනට ස්වර්තමලර්ට සහ වෙනත් අයට අයිති වත්ත ද, නැගෙනහිරට : පටුමග ද , දකුණට : ත්‍රිකුණාමල පාර ද, බස්නාහිරට : ටී. ජෙයසිංගම්ට සහ වෙනත් අයට අයත් වත්ත ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් එකක (අ. 0 රූ. 2 පර්. 1) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. සේගරාජසිංගම්,
කළමනාකරු.

ලංකා බැංකුව,
චෙන්කලඩි.

02-372

---

### ලංකා බැංකුව

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

ණය යොමු අංකය : 73378376, 76079860.

කඳාන, රිලඋල්ල, සදාසරණ මාවත, අංක 43/3 හි ජේ. එස්. ප්‍රනාන්දු මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 දෙසැම්බර් මස 11 දිනැති අංක 1945 දරන *ගැසට් පත්‍රයේ* හා 2015 දෙසැම්බර් මස 01 වැනි දින ''ඩේලිනිව්ස්, ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2016 මාර්තු මස 05 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාවේ කඳාන උපකාර්යාලයේ රිලවුල්ලෙහයි පිහිටි සදාසරණ මාවතෙහි පිහිටි ''බංග්ලෝ බ්ලොක්'' නමැති එහෙත් ''බංගලාවත්ත'' ලෙස ලියාපදිංචි වී ඇති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ඩී. ජී. සී. ගුණසේකර විසින් සාදන ලද 1999 නොවැම්බර් මස 27 දිනැති අංක 1911 දරන පිඹුරෙහි ලොට් 3 සී ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 3 සී උතුරට : ලොට් අංක 5 සහ 3 බී ද, නැගෙනහිරට : ඒ. එම්. ජෝශප් සිල්වාට අයත් දේපළ ද, දකුණට : ඒ. එල්. පෙරේරාගේ දේපළ ද, බස්නාහිරට : ලොට් 4 සහ 5 ද මායිම්ව එකී අංක 1911 දරන පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම නවයයි බිංදුවක (අ. 0 රූ, 0 පර්. 11.90) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 448/250 හි ලියාපදිංචි කර ඇත.

**ඉහත සඳහන් දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාවේ කඳාන උපකාර්යාලයේ රිලවුල්ලෙහි පිහිටි සදසරණ මාවත දිගට පිහිටි ''බංග්ලෝ බ්ලොක්'' නමැති එහෙත් ''බංගලාවත්ත'' නමින් ලියාපදිංචිව ඇති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්.ඩී. ජී. සී. ගුණසේකර විසින් සාදන ලද 1999 නොවැම්බර් මස 27 දිනැති අංක 1911 දරන පිඹුරෙහි ලොට් 5 (අඩි 12 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට : ලොට් 1 හා 2 ද, නැගෙනහිරට : ලොට් 3 ඒ, 3 බී සහ 3 සී ද, දකුණට : ලොට් 4 සහ 3 සී ද, බස්නාහිරට : සදසරණ මාවත ද, මායිම්ව එකී අංක 1911 දරන පිඹුරට අනුව පර්චස් හයයි දශම හයයි බිංදුවක (අ. 0 රූ. 0 පර්. 6.60) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 448/246 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. කොඩිතුවක්කු මහතා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්).

ලංකා බැංකුව,
පිටකොටුව.

02-373

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

හිනිදුම්පත්තු ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0035 1000 7262.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014.01.09 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් තුන් ලක්ෂ හැත්තෑ හත් දහස් හාරසිය පනස් හතරයි ශත අනූ දෙකක (රු. 53,77,454.92) මුදල ද, 2013 නොවැම්බර් මස 13 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ නම ලක්ෂයක (රු. 1,900,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) හා තවත් රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.03.28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2014.03.17 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2016.04.27 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම් පත්තුවේ හබරකඩ, නැගෙනහිර හබරකඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි ''නාරකොපුවාව'' (නඩු අංක පී/5485 ගාල්ල දිස්ත්‍රික් උසාවියේ තැන්පත් කර ඇති ලේඛනයේ) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එෆ්. ගුරුගේ යන අය විසින් සාදන ලද 1979 මැයි 08 දතම හා අංක 2367 පී දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන් කොට ලොට් 38බී, 40, 41 සහ 42 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 38A සහ රජයේ ඉඩම නැගෙනහිරට : රජයේ ඉඩම සහ මෙම ඉඩමේ ලොට් 43, දකුණට : හිනිදුම සිට නෙළුව දක්වා මහා මාර්ගය සහ මෙම ඉඩමේ ලොට් 39 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 39 සහ ලොට් 44 (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් හතරයි දශම දෙකයි දෙකයි පහයි හයක් (අ. 1 රූ. 0 පර්. 4.2256) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2367 පී දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඩබ්. 01/25 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මෑත දී කරන ලද මිනුමට අනුව :

එකී නැගෙනහිර හබරකඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි ''නාරකොපුවාව'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. වී. පී. බී. කීර්තිලාල් යන අය විසින් සාදන ලද 2011 සැප්තැම්බර් මස 29 දතම හා අංක 883 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2367 දරන පිඹුරේ ලොට් 38ඒ සහ රජයේ ඉඩම නැගෙනහිරට : රජයේ ඉඩම සහ අංක 2367 දරන පිඹුරේ ලොට් 43 දකුණට : හිනිදුම සිට නෙළුව දක්වා මහා මාර්ගය සහ මෙම ඉඩමේ ලොට් 39 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 39 සහ වතුයායට පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් හතරයි (අ. 1 රූ. 0 පර්. 4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 883 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

02-398/4

---

**සෙලාන් බැංකුව පීඑල්සී - හැව්ලොක්ටවුන් ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ කොළඹ 07 පදිංචි ජයවීර ආරච්චිගේ දසරත් ලූෂන් පෙරේරා යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව සීමාව තුළ තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තිඹිරිගස්යාය ටොරිංටන් ඇවනිව් දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 2002.11.12 දිනැති අංක 2074 දරන සැලැස්මේ නිරූපනය වන ටොරිංටන් ඇවනිව් වරිපනම් අංක 290/2 දරන ලොට් එෆ් ලකුණු කළ නිවස සමග බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2074 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම එකයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 9.12) නොහොත් හෙක්ටයාර් 0.0231 විශාල ඉඩම.

පෙර කී තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තිඹිරිගස්යාය ටොරිංටන් ඇවනිව් දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 2002.11.12 දිනැති එකී අංක 2074 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් ඒ සහ ඊ (පාර සඳහා වෙන් කිරීමක් වන) ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2074 දරන සැලැස්ම අනුව පර්චස් හතරයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 4.50) *නොහොත්* හෙක්ටයාර් 0.0114 සහ ලොට් ඊ පර්චස් හයයි දශම දෙකයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 6.22) *නොහොත්* හෙක්ටයාර් 0.0157 විශාල ඉඩම.

පයින් ගමන් කිරීමට සහ වාහන ගමනාගමනයට මාර්ග අයිතිය සමග සහ වෙනත් භාවිතා කරන්නන් හට මාර්ගය තුළ උඩින්, දිගේ සහ යටින් විදුලි කේබල්, දුරකථන රැහැන්, උඩුරැහැන්, ප්‍රධාන ජලනල, ජලප්‍රවාහන නල, අපද්‍රව්‍ය නල යෙදීමේ අයිතිය සමග.

බස්නාහිර පළාතේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරීන්ගේ කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තිඹිරිගස්යාය පාර පිහිටි බලයලත් මිනින්දෝරු රංජිත් කරුණාරත්න විසින් සාදන ලද 1976.08.04 දිනැති අංක 346 දරන සැලැස්මේ නිරූපනය වන දෙල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 6 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 346 දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනයි දශම හතරයි හතක් (අ. 0 රූ. 0 පර්. 23.47)ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2016 පෙබරවාරි මස 29 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - තිඹිරිගස්යාය මංසන්ධියේ සිට තිඹිරිගස්යාය පාර ඔස්සේ නාරාහේන්පිට දෙසට මීටර් 550 ක පමණ දුරක් ගිය විට වම්පසට ඇති ටොරිංටන් ඇවනිව් පාර හමුවේ. එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට අදල දේපලෙහි ප්‍රධාන ගේට්ටුව හමුවේ. බෞද්ධාලෝක මාවතෙන් ටොරිංටන් ඇවනිව් මාර්ගය ඔස්සේ පැමිණි විට ද අදල දේපළට පිවිසිය හැක.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2014.03.07 වැනි දින පළවී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2014.03.10 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2014.02.19 වැනි දින පළ වී ඇත.

